# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 159 — 1975 අප්‍රේල් 11 වැනි සිකුරාදා — 1975.04.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... | 247 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 245 | මිළ පාලන දැන්වීම ... ... | ... 257 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම ... ... | ... — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම සහ වියදම පිළිබඳ වාර්තා ... | ... — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... | ... — |
| වෙනත් පත් කිරීම් ආදිය ... — ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම ... ... | ... 259 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම ... | ... — |


## ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය

**1975 අංක 180**

අංකය: ඩී 298/ආර්ජීසීවී.

යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම් සහ පත් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනවල සිට කර්නල්වරුන් වශයෙන් :—

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) එම්. එන්. පීල්ලා, ශ්‍රීලයුවෙබ—1973 ඔක්තෝබර් 15.

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) ඩී. ඩී. හේවාගම, ශ්‍රීලයුපොදුසේබ—1973 ඔක්තෝබර් 15.

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) ජේ. ඩී. සොයිසා, එම්බීඊ. ශ්‍රීලපාහ—1973 ඔක්තෝබර් 15.

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) ට්. එස්. බී. සලි, ශ්‍රීලසිරෙ—1974 ජනවාරි 01.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ට්. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 02 දින,
කොළඹ දී ය.

4-278—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**1975 අංක 181**

අංකය: ඩී 298/ආර්ජීසීවී/(II).

යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම් සහ පත් කිරීම්

උසස් කිරීම්

ලුතිනන් කර්නල් ජී. ආර්. ජයසිංහ, ලයුයුබ—1974 සැප්තැම්බර් මස 08 දින සිට තාවකාලික කර්නල් වශයෙන්.

මේජර් එල්. ජී. සිගේරා, ලයුයුබ—1974 සැප්තැම්බර් මස 08 දින සිට තාවකාලික ලුතිනන් කර්නල් වශයෙන්.

පත් කිරීම්

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) ජී. ආර්. ජයසිංහ, ලයුයුබ—1974 සැප්තැම්බර් මස 08 දින සිට ආධාරක සේනා සමූහයේ ආඥාපති වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) එල්. ජී. සිගේරා, ලයුයුබ—1974 සැප්තැම්බර් මස 08 දින සිට ලංකා යුද්ධ හමුදා යුද්ධායුධ බලකායේ අණදෙන නිලධාරී වශයෙන්.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ට්. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 02 දින,
කොළඹ දී ය.

4-279—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1974 ජනවාරි මස 1 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


245—බී 71668—10,547 (75/3)

**1975 අංක 182**

අංකය : සී 17/ආර්සීපී.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත්වීම අත් හැර යාමක් සහ පත් කිරීමක්**

**පත්වීම අත් හැර යාම**

යුද්ධ හමුදා පනතේ (357 අධිකාරය) 13(1) වගන්තිය යටතේ, පහත නම සඳහන් නිලධාරියා, 1975 මාර්තු මස 01 දින සිට ආධුනික සිත් බඳවන නිලධාරියෙකු වශයෙන් වන පත්වීම අත් හරින ලදී :—

ලුතිනන් ඩී. එම්. ජී. සරත්චන්ද්‍ර, ලයුසෝබ.

**පත් කිරීම**

යුද්ධ හමුදා පනතේ (357 අධිකාරය) 13(1) වගන්තිය යටතේ, පහත නම සඳහන් නිලධාරියා, 1975 මාර්තු මස 01 දින සිට ආධුනික සිත් බඳවන නිලධාරියෙකු වශයෙන් :—

ලුතිනන් එම්. ආර්. යූ. බණ්ඩාරතිලක, ලයුසෝබ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 01 දින,
කොළඹ දීය.

4-258—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

**1975 අංක 183**

අංකය : ඊ1/ආර්සීපී/89.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරයට පත් කිරීම්**

පහත නම් සඳහන් ශිෂ්‍ය භට නිලධාරීන් 1975 අප්‍රේල් මස 19 වෙනි දින සිට පෙන්වා ඇති ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට අනුව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් වරුන් වශයෙන් අධිකාරයට පත් කිරීම සහ එම දින සිට ඔවුනගේ නම් ඉදිරියෙන් දක්වා ඇති බලකා/රෙජිමේන්තුවලට ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් ප්‍රසාදය පළ කර ඇත :—

ශිෂ්‍ය භට නිලධාරී ලක්ෂ්මන් නාඩරාජසිංහම්—ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය

ශිෂ්‍ය භට නිලධාරී ගේබ්‍රියල් මෝහන් රොක්වුඩ්—ශ්‍රී ලංකා පාබල හමුදාව

ශිෂ්‍ය භට නිලධාරී වසන්ත නිහාල් රංජිත් රාජසේකර—ශ්‍රී ලංකා සංඥා බලකාය

ශිෂ්‍ය භට නිලධාරී පාරින්ද්‍ර ඉන්ද්‍රජිත් අබේවර්ධන—ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය

ශිෂ්‍ය භට නිලධාරී වසන්ත අබේරත්න පමුණුව—ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය

ශිෂ්‍ය භට නිලධාරී උංගෙමණ්ඩඩිගේ බර්නාඩ් ලෝරන්ස් ප්‍රනාන්දු—ශ්‍රී ලංකා පාබල හමුදාව

ශිෂ්‍ය භට නිලධාරී ලියන ආරච්චිගේ රූපසිරි විජේරත්න—ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

ශිෂ්‍ය භට නිලධාරී රාජපක්ෂ කෝනාරමුදියන්සේලාගේ ජයම්පති බණ්ඩාර විජේරත්න—ගැමුණු හේවා බලඇණිය

ශිෂ්‍ය භට නිලධාරී ආබිගේ ඔස්වින් මහින්ද ප්‍රනාන්දු—ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය

ශිෂ්‍ය භට නිලධාරී අර්ල් පරාක්‍රම විජේනායක—ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය

ශිෂ්‍ය භට නිලධාරී බලාපුවඩුගේ ප්‍රීති ශ්‍රීමල් මැන්දිස්—ගැමුණු හේවා බලඇණිය

ශිෂ්‍ය භට නිලධාරී රේණුකා බණ්ඩාර කිරිඇල්ල—ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද්ධෝපකරණ බලකාය

ශිෂ්‍ය භට නිලධාරී නිශ්ශංක විජේසිංහ—ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

ශිෂ්‍ය භට නිලධාරී සජීවා තිස්ස අබේරත්න—ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද්ධෝපකරණ බලකාය

ශිෂ්‍ය භට නිලධාරී බලාපුවඩුගේ ඔලාසියුස් සුසන්ත මෙන්දිස්—ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

ශිෂ්‍ය භට නිලධාරී ගල්බොඩ ආරච්චිගේ රංජිත් සිසිර කුමාර—ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

ශිෂ්‍ය භට නිලධාරී අතුල කුමාර සමරසේකර—ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය

ශිෂ්‍ය භට නිලධාරී මඩපාතගේ පියසිරි ආරියවංශ—ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය

ශිෂ්‍ය භට නිලධාරී විකිරියාදුර තිස්ස රංජිත් ද සිල්වා—ශ්‍රී ලංකා පාබල හමුදාව

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 02 දින,
කොළඹ දීය.

4-260—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

**1975 අංක 184**

අංකය : ඩී 306/ආර්සීපී.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත් කිරීම්**

1975 ජනවාරි මස 1 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මාණ්ඩලික ප්‍රධානියා වශයෙන් ගෲප් කැප්ටන් ඩබ්ලිව්. බී. එච්. එස්. ඩබ්ලිව්. ගුණතිලක (01035) පොදු රාජකාරි/නියමු පත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 02 දින,
කොළඹ දී ය.

4-277—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

**1975 අංක 185**

අංකය : සී 252/ආර්සීපී/5.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1973 ජනවාරි මස 1 වන දින සිට ස්ථිර ගෲප් කැප්ටන්වරුන් වශයෙන් :—

තාවකාලික ගෲප් කැප්ටන් හබරකඩ ආරච්චිගේ දෙන් රණසිංහ (01011)—කාර්මික/සංඥා

තාවකාලික ගෲප් කැප්ටන් ඇන්ටන් හක්ස්ලි පුෂ්මානසිංහ (01025) උපකරණ

තාවකාලික ගෲප් කැප්ටන් වෙල්ලාරච්චිගේ දෙන් හැරල්ඩ් සුමතිපාල විජේසිංහ ගුණතිලක (01035)—පොදු රාජකාරි/නියමු.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 02 දින,
කොළඹ දී ය.

4-276/1—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**1975 අංක 186**

අංකය : ඕ 252/ආර්ඊසීවී/5.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ශ්‍රී ලංකාවේ ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1973 මාර්තු මස 1 වන දින සිට ස්ථිර ගෲප් කැප්ටන් වශයෙන් :—

තාවකාලික ගෲප් කැප්ටන් දෙන් ඔන්ද්‍රල සනත් වීරත්න (01040)—පාලන

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 02 දින,
කොළඹ දී ය.

4–276/2—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**1975 අංක 187**

අංකය : ඕ 252/ආර්ඊසීවී/5.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ශ්‍රී ලංකාවේ ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1975 ජනවාරි මස 1 වන දින සිට ස්ථිර ගෲප් කැප්ටන් වශයෙන් :—

තාවකාලික ගෲප් කැප්ටන් ඕක් සත්බව් පෙරේරා (01037) පොදු රාජකාරි/නියමු.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ටී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1975 අප්‍රේල් මස 02 දින,
කොළඹ දී ය.

4 276/3—75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

# ආණ්ඩුවේ නිවේදන

**පොල් සැකසුම් මණ්ඩලය**

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ (1 කොටස) 3 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, පහත නම් සඳහන් අය 1975 අප්‍රේල් මස 07 දින සිට පොල් සැකසුම් මණ්ඩලයේ සාමාජිකයන් ලෙස මෙයින් පත් කරමි.

1. ඒ. කේ. තේ සරත් නම් මහතා.
2. එල්. එන්. ද එල්. බණ්ඩාරනායක මහතා.
3. වෛද්‍යාචාර්ය ජේ. සිවප්‍රගාසම් මහතා.
4. මුදලිඳු ජී. ඊ. ද ඉසෙඩ්. සිරිවර්ධන මහතා.
5. සේපාල ගුණසේකර මහතා.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

4–270—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**පොල් වගා මණ්ඩලය**

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ (1 වන කොටස) 3 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, පහත නම් සඳහන් අය 1975 මාර්තු මස 30 දින සිට පොල් වගා මණ්ඩලයේ සාමාජිකයන් ලෙස මෙයින් පත් කරමි.

1. ඩබ්ලිව්. ගුණසේකර මහතා
2. එල්. ඊ. ඒ පොන්සේකා මහතා
3. ආචාර්ය යූ. පෙතියගොඩ මහතා
4. ජී. එල්. ඩී. පී. සේනාරත්න මහතා
5. අජිත් අසරප්පා මහතා
6. ඩී. පී. පියසේන මහතා
7. ඩබ්ලිව්. බී. මැදගම මහතා.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

**පොල් වගා මණ්ඩලය**

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ (1 වන කොටස) 3 (2) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, 1975 මාර්තු මස 30 වැනි දින සිට ඩබ්ලිව්. ගුණසේකර මහතා පොල් වගා මණ්ඩලයේ සභාපති ලෙස මෙයින් පත් කරමි.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

4–141/1—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**පොල් අලෙවි මණ්ඩලය**

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ (1 වන කොටස) 3 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, පහත නම් සඳහන් අය 1975 මාර්තු මස 30 දින සිට පොල් අලෙවි මණ්ඩලයේ සාමාජිකයන් ලෙස මෙයින් පත් කරමි.

1. ආචාර්ය එස්. තිලකරත්න මහතා
2. පී. වත්තේගම මහතා
3. ඒ. ජී. වාස් මහතා
4. කාමිණි විතාරණ මහත්මිය
5. ඩබ්ලිව්. එන්. එම්. කුමාරරත්නම් මහතා
6. අයිවන් සමරවික්‍රම මහතා
7. ආර්. බී. රාජගුරු මහතා

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

**පොල් අලෙවි මණ්ඩලය**

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ (1 වන කොටස) 3 (2) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, 1975 මාර්තු මස 30 වැනි දින සිට ආචාර්ය එස්. තිලකරත්න මහතා පොල් අලෙවි මණ්ඩලයේ සභාපති ලෙස මෙයින් පත් කරමි.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

4–141/2—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

### පොල් පර්යේෂණ මණ්ඩලය

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ (1 වන කොටස) 8 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, පහත නම් සඳහන් අය 1975 මාර්තු මස 30 දින සිට පොල් පර්යේෂණ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස මෙයින් පත් කරමි.

1. වෛද්‍යාචාර්ය ජේ. සිවප්‍රගාසම් මහතා
2. ආචාර්ය ජේ. එල්. ඩබ්ලිව්. පීරිස් මහතා
3. ආචාර්ය සී. පානබොක්කෙ මහතා
4. ආචාර්ය ඩී. එස්. පීරිස් මහතා
5. ඒ. එඩ්මන් පෙරේරා මහතා
6. පී. ඩබ්ලිව්. ආර්. ද සිල්වා මහතා.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

### පොල් පර්යේෂණ මණ්ඩලය

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ (1 වන කොටස) 8 (2) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, 1975 මාර්තු මස 30 වැනි දින සිට වෛද්‍යාචාර්ය ජේ. සිවප්‍රගාසම් මහතා පොල් පර්යේෂණ මණ්ඩලයේ සභාපති ලෙස මෙයින් පත් කරමි.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

4–141/3 —75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

### 1971 අංක 38 දරණ මුදල් පනත

28 (අ) වගන්තිය යටතේ නිවේදනය

1974 අංක 7 දරණ මුදල් (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද, 1971 අංක 38 දරණ මුදල් පනතේ 28 (අ) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන ඇමති ලෙස්ලි සයිමන් ගුණවර්ධන වන මම, (වෙළෙන්දෙකුගේ බලපත්‍රයක් හෝ ආගන්තුකයෙකුගේ තාවකාලික බලපත්‍රයක් සඳහා වූ අයදුම්පත් හැර) 1975 වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබාගැනීම සඳහා වූ සෙසු සෑම අයදුම්පතක් ම ඉදිරිපත් කළ යුතු අවසාන දිනය 1975 මාර්තු මස 31 වෙනි දින බව මෙම නිවේදනය මගින් නියම කරමි.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන ඇමති.

1975 මාර්තු 21 වෙනි දින,
කොළඹ දී ය.

4–155—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය.

අංකය 543ඊ 141/බී (XI).

### තනතුරු විශ්‍රාම වැටුප් හිමි තනතුරු වශයෙන් ප්‍රකාශයට පත්කිරීම

මෙයට ඇතුලත් උපලේඛනයේ II වැනි තීරයෙහි නියමිත දෙපාර්තමේන්තු වෙහි එයට අනුරූපව I වැනි තීරයෙහි නියමිත එක් එක් තනතුරු දරන සෑම තැනැත්තෙකුම එම තනතුරට පත් කරනු ලැබූ දින සිට විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ඇත්තෙකු බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර සහ එම ව්‍යවස්ථාවල විධිවිධානයන්ට යටත්ව දන්වනු ලැබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1975 මාර්තු මස 14 දින,
කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ පිහිටි,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දීය.

උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| අතිරේක ලේකම් (1973.8.23 සිට කේ. බී. දිසානායක මහතා විසින් දරණ තෙක්) ... | විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය |
| ලේකම්වරු (ගෙවල් කුලී මණ්ඩල)— ... (1973.8.1 සිට එම් බී. එස්. සුනන්දරත්න, පී. ඒ. ඩී. පෙරේරා, පී. එම්. විල්සන් සහ පී. පී. කොඩිතුවක්කු යන මහතුන් විසිනුත් 1973.10.1 සිට ඇම්. ඇස්. ජයසූරිය මහතා විසිනුත් දරණ තෙක්) | ජාතික නිවාස දෙපාර්තමේන්තුව |
| බලයලත් නිලධාරී— ... (1974.3.15 සිට පියදාස තෙන්නකෝන් මහතා විසින් දරණ තෙක්) ... | ජාතික නිවාස දෙපාර්තමේන්තුව |
| කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ මුදල් නිළධාරී (එස්. මයිල්වාගනම් මහතා විසින් දරණ තෙක්) | කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය. |
| රසායනාගාර කාර්මික— (ඒ. එම්. වී. ආර්. මනතුංග මහතා විසින් දරණ තෙක්) | ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානය. |
| නියෝජ්‍ය වැඩ සටහන් අධ්‍යක්ෂ— (ඩී. ටී. රාජරත්නම් මහතා විසින් දරණතෙක්) ... | නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය |
| අතිරේක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ... (සී. ජේ. වීරසේකර මහතා විසින් දරණතෙක්—72.01.30 සිට 73.02.26 දක්වා) ... | නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්— (සී. ජේ. වීරසේකර මහත විසින් 73.02.27 සිට දරණ තෙක්) ... | නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය |
| සහකාර ලේකම් (අභ්‍යන්තර විගණන)— (ඊ. එම්. ඩී. ඩබ්ලිව්. චන්ද්‍රසේකර මහතා විසින් දරනතෙක්) | නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය |
| ව්‍යාප්ති නිලධරින්— (ඩබ්ලිව්. එම්. ඒ. වීරසේකර, ටී. මනෝහරන්, පී. වරකදෙනිය, ඇම්. ඒ. විජේසූරිය, ටී. ඒ. නන්දසිංහ සහ අයි. එන්. එම්. පෙරෙයිරා යන මහතුන් විසින් දරණ තෙක්) ... | සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව. |
| ගොවිපල කලමනාකරු— (1973.9.1 සිට පී. එච්. ගුණසිරි මහතා විසින් දරණ තෙක්) | සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව |

4–183—75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

### 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත

බලතල පැවරීම

නියෝගය

1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 2 (2) වෙනි වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල අනුව, විදේශීය හා දේශීය වෙළඳ ඇමති, ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාට සහායවීමට පත්කර ඇත්තාවූ මීට අමුණා ඇති උපලේඛනයේ I වෙනි තීරුවෙහි සඳහන් එක් එක් අය වෙත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ රෙජිස්ට්‍රාර්තුමා වෙත පැවරී ඇත්තාවූ එකී උපලේඛනයේ II වෙනි තීරුවෙහි සඳහන් සියළුම බලතල මෙයින් පවරමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1975 මාර්තු 28 දින,
කොළඹ දීය.

### I වැනි තීරුව

1. හිතක රූපවංශ ද සිල්වා
2. පෝරගේ රංජිත් පෙරේරා
3. දේවගිරිගේ දයාරත්න ධර්මසිරි
4. අශෝකා පද්මිණි මුණසිංහ
5. වජිරනාත් හපුතන්ත්‍රි
6. තිලකරත්න හපන්ගම
7. කෝකු හැන්නැදිගේ වීරසේන
8. දෙලවත්ත අප්පුහාමිල්ලාගේ දෙන් ජයවර්ධන
9. වීරසේන කළුපහන
10. ධර්මසේන දිසානායක

### II වැනි තීරුව

සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 33, 42, 43, 44, (44 (6) හැර) 45, 46, 47, 50, 52, 53, 54, 58, (58 (2) (අ) සහ 58 (5) හැර) 59, 68 සහ 72 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියළුම බලතල.

රීති මාලාවෙ 4, 11, 15, 16 (II), 18, 19, 20, 33, 37, 39, 40, 41, 42, 43, 48, 49 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියළුම බලතල.

4–184—75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

### පඩි පාලක සභා ආඥාපනත

#### නිවේදනයයි

1974 අගෝස්තු මස 10 වන දින සිට අවුරුදු තුනක කාලයක් තුළ ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටිමට (136 වන අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු ඇමති තුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව වර්ෂ 1971 පඩි පාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1975 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

නම නියමකොට පත් කරන සාමාජිකවරු :

1. ආචාර්ය කමල් කරුණානායක මහතා
2. ජී. ඩබ්ලිව්. ජයසූරිය මහතා
3. වී. ඇජ්. ගුණරත්න මහතා

සේව්‍ය නියෝජිතවරු :

1. ටී. ඇස්. අප්පදොරේ මහතා
2. ආර්. ජී. පීරිස් මහතා
3. පී. ඒ. කරුණාරත්න මහතා
4. එච්. ඇන්. සී. ප්‍රනාන්දු මහතා
5. ඩී. ඩබ්ලිව්. පොන්මිපියගේ මහතා
6. ඇස්. ඒ. ඩබ්ලිව් සුබසිංහ මහතා
7. කේ. ඩී. ඇස්. සිරිවර්ධන මහතා
8. ජී. එච්. ද අල්විස් මහතා

සේවක නියෝජිතවරු :

1. ඩබ්ලිව්. ඇල්. ප්‍රනාන්දු මහතා
2. ඩී. ඇම්. ජෝන් සිංඤෝ මහතා
3. ජයන්ත ජයවීර මහතා
4. ෂෙල්ටන් ගුණතිලක මහතා
5. ආර්. ජේසුදාසන් මහතා
6. බස්ටින් ප්‍රනාන්දු මහතා
7. ඒ. ඩබ්ලිව්. පෙරේරා මහතා
8. කේ. ඩී. මෙන්ඩිස් මහතා

4-244 —75. 04. 11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

### විනිමය පාලන පනත

(423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 44 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමය.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1975 මාර්තු මස 24 වන දින,
කොළඹ දී ය.

#### නියමය

කිසියම් නැව් හෝ ගුවන් සමාගමක් විසින් ශ්‍රී ලංකාවට පැමිණෙන යම් යාත්‍රාවක් හෝ ගුවන් යානාවක ශ්‍රී ලංකාවට ගෙන එනු ලබන්නා වූ ද, එම යාත්‍රාවෙන් හෝ ගුවන් යානයෙන් ගොඩ නොකොට ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යනු ලබන බවට ප්‍රධාන රේගු අයකැමි සෑහීමට පත් වන්නා වූ ද යම් රත්රන් සම්බන්ධයෙන් (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 21 වන වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කිරීමත් මෙයින් ලබා දෙනු ලැබේ.

4–237—75. 04. 11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

ඇල්. සී. බී. 60/34.

### රේගු ආඥාපනත

#### රේගු නිවේදනය අංක 1/75 දරන බැඳුම්කරය

ප්‍රධාන රේගු අයකැමි ගයානන්ද කුමාරණතුංග වන මම, රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 69 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, ගරු මුදල් ඇමතිතුමා විසින් ඒ වගන්තියෙන් එතුමා වෙත පැවරී ඇති බලතල යටතේ දෙන ලද අනුමැතිය අනුව එතුමාගේ නියමය පරිදි පළ කරනු ලබන මේ නිවේදනයෙන්, කොළඹ 13, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ අංක 76/1දරණ ස්ථානයේ පිහිටි (158′ 6″, 52′ 6″, 17′ 6″ ප්‍රමාණයෙන් යුතු) ගබඩාව සිමාසහිත සිලෝන් ටුබැකෝ සමාගම විසින් ආනයනය කරනු ලබන දුම්කොළ ප්‍රථම ඇතුළත් කරවීමේදී තීරු ගාස්තු නොගෙවා ගබඩා කළ හැකි, තැබිය හැකි සහ ආරක්ෂාවෙහි තැබිය හැකි ගුදමක් වශයෙන් අනුමත කොට නියම කරමි.

ගයානන්ද කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි.

1975 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

4-180—75. 04. 11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, ඒ වගන්තිය යටතේ කරනු ලැබ 1974 නොවැම්බර් මස 08 වැනි දින අංක 137 දරන ගැසට් පත්‍රයේ අම්පාර දිස්ත්‍රික්කය තුල පිහිටි කල්මුනේ සුළු නගර සභා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාව සම්බන්ධයෙන් පළ කෙරුණ ආඥාවේ (අ) (1) හා (ආ) හි සඳහන් " කල්මුනේ, කල්මුණේ කුඩි 4, කාසිම් විදිය පදිංචි අසනාර් අලියාර් අබ්දුල් රහීම් මහතා " යන වචන වෙනුවට " කල්මුනේ, කල්මුනේකුඩි 4, කාසිම් විදිය පදිංචි අසනාර් හාජියාර් අබ්දුල් රහීම් මහතා " යන වචන ආදේශ කර මෙයින් සංශෝධනය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1975 අප්‍රේල් මස 02 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

4–269—75. 04. 11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

### සමගි මණ්ඩල පනත

#### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1974 ජූලි මස 19 වැනි දින අංක 121 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 32 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කළුතර දිස්ත්‍රික්කය තුල පිහිටි ඉත්තෑපාන ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) ඉත්තෑපාන පදිංචි හේවාගේ කරලිස් විජේසිංහ මහතා
(2) යගිරල, ගම්මන, ශෝභිත පිරිවෙනෙහි පූජ්‍ය ඉඳුරුවේ ධම්මානන්ද ස්වාමින් වහන්සේ
(3) ඉත්තෑපාන, 'නිමල්' හි පදිංචි තඹිවිටගේ දොන් ධර්මවික්‍රම කරුණාරත්න මහතා
(4) ඉත්තෑපාන පදිංචි දේමුනි අදිකාරම් කුලසේන මහතා
(5) ඉත්තෑපාන, දූවගොඩ පදිංචි සුබසිංහ ආරච්චිගේ චාර්ලිස් මහතා
(6) ඉත්තෑපාන, ගනේවත්ත පදිංචි ඩේවිඩ් චාර්ලිස් විජේසිංහ ගුණතිලක මහතා
(7) යගිරල, කරපාගල පදිංචි උඩුගම කෝරාලලාගේ දොන් ප්‍රාන්සිස් අප්පුහාමි මහතා
(8) වලල්ලාවිට පදිංචි කන්නන්ගර කෝරාලලාගේ මහින්ද දාස කන්නන්ගර මහතා
(9) වලල්ලාවිට, 'සැනසුම' හි පදිංචි රිල්ලපල ලියනගේ විලියම් මහතා
(10) ඉත්තෑපාන, මාලඹේ, 'සේනානි' හි පදිංචි දොන් පියෝරිස් තඹවිට මහතා
(11) මතුගම, පරෙයිගම පදිංචි බද්ද විතානගේ තිලකරත්න මහතා
(12) ඉත්තෑපාන, මීරිස්වත්ත පදිංචි දොන් සිඩ්නි සමරසුන්දර මහතා
(13) ඉත්තෑපාන, 'සිරිවාස' හි පදිංචි බෙන්තර හේවාගේ ඇල්පිනෝනා ජයතුංග මහත්මිය
(14) ඉත්තෑපාන, ගලතර පදිංචි පියසේන ද අල්විස් ගුණවර්ධන මහතා
(15) යගිරල, හොරකඳුව පදිංචි ජයසුන්දරගේ චාර්ලිස් මහතා
(16) යගිරල පදිංචි ගමගේ දොන් ආරෝන් හේමපාල මහතා
(17) වලල්ලාවිට, 'සිසිර' හි පදිංචි වලල්ලාවිට කංකානම්ගේ ජූලියන් මහතා
(18) වලල්ලාවිට, මගුරුමස්විල පදිංචි කුලප්පු තන්ත්‍රිගේ දොන් පීටර් මහතා
(19) වලල්ලාවිට, ගුලවිට පදිංචි ජෝන් කොළඹ ආරච්චි මහතා
(20) වැලිපැන්න, ඌරගොඩ පදිංචි ඇලබඩ ආරච්චිගේ පීරිස් මහතා
(21) වැලිපැන්න, දොඹම්පාපිටිය පදිංචි මාපිංග විමලසේන මහතා
(22) වැලිපැන්න, පත්තල පදිංචි කන්නන්ගර කෝරාළලාගේ දොන් ධර්මදාස මහතා
(23) ඉත්තෑපාන, පූල්බද්දූව, පදිංචි දොන් ආබ්‍රහම් කන්නන්ගර මහතා
(24) ඉත්තෑපාන, මාකලන්දාව පදිංචි කිරිවිතානගේ දොන් පියසේන තිලකරත්න මහතා
(25) ඉත්තපාන, අඹුහුන්තුඩුව පදිංචි හේවාගේ පියසේන මහතා
(26) වලල්ලාවිට, ගුලවිට පදිංචි කත්දබඩගේ අනෝනා විජේනායක මහත්මිය
(27) වලල්ලාවිට පදිංචි සුගතපාල මල්ලවාරච්චි මහතා
(28) ඉත්තෑපාන, මල්ලියවත්ත පදිංචි වලකඩ අප්පුහාමිගේ පේමවතී මහත්මිය
(29) යගිරල, ගම්මන පදිංචි කුලප්පු තන්ත්‍රිගේ ගුණපාල මහතා

(ආ) ඉත්තෑපාන පදිංචි හේවාගේ කරෝලිස් විජේසිංහ මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1975 මාර්තු මස 25 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

4–182/1—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

#### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1974 ජූලි මස 19 වැනි දින අංක 121 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමෙහි උප ලේඛනයෙහි අංක 9 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ පුත්තලම්-හලාවත දිස්ත්‍රික්කය තුල පිහිටි මුන්නේශ්වරම් පත්තු ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) මුගුණුවටවන පදිංචි කීර්ති ශ්‍රී සිංහ එළියනායක මුදියන්සේලාගේ පීරිස් සිංඤෝ මහතා
(2) ඉලිප්පදෙනිය පදිංචි කුමාර ගමගේ පුංචි සිංඤෝ මහතා
(3) බංගදෙනිය පදිංචි හෙට්ටිආරච්චිගේ ඇන්ටනි පෙරේරා මහතා
(4) බංගදෙනිය පදිංචි අළුවිහාරේ ලියනආරච්චිගේ පියදාස මහතා
(5) බංගදෙනිය පදිංචි හේවගොල්ලගේ පියදාස මහතා
(6) බංගදෙනිය, දිගන්වැව පදිංචි චන්ද්‍රසේකර ගුණහේරත් හිටිහාමිලාගේ හේන්ද්‍රික් සිංඤෝ මහතා
(7) බිංගිරිය, මහවිලත්තාව පදිංචි හේරත් මුදියන්සේලාගේ ලීලාරත්න තිලකනායක මහතා
(8) බිංගිරිය, මහවිලත්තාව පදිංචි හේරත් මුදියන්සේලාගේ සිංඤෝ අප්පුහාමි මහතා
(9) බිංගිරිය, සිප්පිකලාන පදිංචි එසදලාගේ පුංචාගේ මැණිකා මහතා
(10) ඉලිප්පදෙනිය, මුංගන්දළුව පදිංචි ගජමුතු ලංකාතිලක චන්ද්‍රප්පුලිගේ ප්‍රේමදාස මහතා
(11) ඉලිප්පදෙනිය, මුංගන්දළුව පදිංචි ගජමුතු ලංකාතිලක චන්ද්‍රප්පුලිගේ පියදාස මහතා
(12) ඉලිප්පදෙනිය, මුංගන්දළුව පදිංචි ගජමුතු ලංකාතිලක චන්ද්‍රප්පුලිගේ නාගරත්න මහතා
(13) ඉලිප්පදෙනිය, කණුකැටිය පදිංචි රන්සළු දේවගේ පුංචියා මහතා
(14) ඉලිප්පදෙනිය, පදිංචි වික්‍රම ආරච්චිගේ කරුණාරත්න මහතා
(15) ඉලිප්පදෙනිය, කරවිට පදිංචි බුලත්සිංහගේ චාර්ලිස් අප්පුහාමි මහතා
(16) මුගුණුවටවන පදිංචි බාලසූරිය මුදියන්සේලාගේ ගුණවර්ධන මහතා
(17) හලාවත, මාදුවන්ගම පදිංචි දිනියදුරගේ වින්සන් සිල්වා මහතා

(18) කුමාරකට්ටුව, එළිවිටිය පදිංචි තෙලිසිංහ හිටිහාමි මුදියන්සේලාගේ පොඩිඅප්පුහාමි මහතා

(19) කුමාරකට්ටුව, මංචලාන පදිංචි හේරත් මුදියන්සේලාගේ පොඩිඅප්පුහාමි මහතා

(20) කුමාරකට්ටුව, එරුන්විල පදිංචි හෙට්ටිආරච්චිගේ විලියම් සිංඤෝ මහතා

(21) කුමාරකට්ටුව, අක්කරවිස්ස පදිංචි කටුනායකගේ ඇන්සිටස් පෙරේරා මහතා

(22) ඉලිප්පදෙනිය, තිස්සෝගම පදිංචි ජයමහ හිටිහාමිලාගේ තන්දප්පුහාමි මහතා

(23) ඉලිප්පදෙනිය, තිස්සෝගම පදිංචි චන්ද්‍රසේකර අධිකාරි කෝරලාගේ හෙන්ද්‍රික් සිංඤෝ මහතා

(24) ඉලිප්පදෙනිය, තිස්සෝගම පදිංචි චන්ද්‍රසේකර අධිකාරි කෝරලාගේ දාවිත් සිංඤෝ මහතා

(25) ඉලිප්පදෙනිය, තිස්සෝගම පදිංචි හෙට්ටිආරච්චිගේ ජෝසප්පු මහතා

(26) මුත්තේශ්වරම පදිංචි හේරත් රංදෙනි කෝරාලාගේ ප්‍රේමදාස මහතා

(27) මුත්තේශ්වරම පදිංචි පටබැඳි කෝරාලාගේ කරුණාසේන මහතා.

(ආ) මුගුණුවටවන පදිංචි කීර්ති ශ්‍රී සිංහ එළියනායක මුදියන්සේලාගේ පීරිස් සිංඤෝ මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1975 මාර්තු මස 27 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

4-182/2—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

සමගි මණ්ඩල පනත

ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1974 ජූලි මස 19 වැනි දින අංක 121 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතේ වූ දන්වීමේ උපලේඛනයෙහි අංක 23 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි පොතුහැර ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) උහුමීය, බුලුපිටිය පදිංචි ජයවීර මුදියන්සේලාගේ විජේරත්න ජයවීර මහතා

(2) පොතුහැර, පනාගමුව පදිංචි ජයසේකර මුදියන්සේලාගේ කිරිමුදියන්සේ ජයසේකර මහතා

(3) පොතුහැර, අහුගොඩ පදිංචි දිවාකර මොහොට්ටාලලාගේ ගුණරත්න බණ්ඩා මහතා

(4) තලවත්තේගෙදර, දඹුගොඩ පදිංචි වන්නිඅච්චිල්ලාගේ කිරිමුදියන්සේ මහතා

(5) පොතුහැර පදිංචි ගම්මන්පිල ඉමියාගේ එඩ්මන් ගම්මන්පිල මහතා

(6) කලුගමුව, සියඹලාවැහැර පදිංචි ගල්මන්ගොඩ ගුරුගේ හේමකීර්ති රූපචන්ද්‍ර මහතා

(7) පොතුහැර, අමුණුගම පදිංචි ජයසුන්දර මුදියන්සේලාගේ පුංචිබණ්ඩා ජයසුන්දර මහතා

(8) වඳාකඩ, ගින්නේරිය පදිංචි කාරියප්පෙරුම අච්චිල්ලාගේ කිත්සිරි සේනාරත්න මහතා

(9) වඳාකඩ, හබරව, අලුත්ගෙදර පදිංචි හේරත් මුදියන්සේලාගේ පුංචි අප්පුහාමි මහතා

(10) පොතුහැර, අල්ගම පදිංචි ඒකනායක මුදියන්සේලාගේ සිරිසේන මහතා

(11) තලවත්තේගෙදර, කලුගමුව පදිංචි වනසිංහ මුදියන්සේලාගේ පිංචිබණ්ඩා වනසිංහ මහතා

(12) පොතුහැර, හඳුනල පදිංචි අබේවික්‍රමගේ දොන් ස්ටීවන් පෙරේරා මහතා

(13) පොතුහැර, අහුගොඩ පදිංචි දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා

(14) පොතුහැර, ලීනගිරිය පදිංචි හේවාවිතාරණගේ ඩේවිඩ් පොන්සේකා මහතා

(15) පොතුහැර, වෙදපොල පදිංචි සමරකෝන් මුදියන්සේලාගේ පිංචිබණ්ඩා මහතා

(16) පොතුහැර, බැවිල්ගමුව පදිංචි කඳනආරච්චිගේ දොන් ලයනල් පියදාස මහතා

(17) වඳාකඩ, හබරව පදිංචි හේරත් මුදියන්සේලාගේ කිරිමුදියන්සේ හේරත් මහතා

(18) පොතුහැර, දෙගල්අස්සේ ගෙදර පදිංචි වේපත් අංගෙලේකම්ලාගේ කිරිමුදියන්සේ මහතා

(19) උහුමීය, ගොඩවිට පදිංචි මාපා මුදියන්සේලාගේ රංහාමි මහතා

(20) පොතුහැර, යටිපොත පදිංචි එදිරිසිංහ මුදියන්සේලාගේ පුංචිරාල මහතා

(21) කුමාරපේලිය, "සුජාතා නිවස" පදිංචි හේරත් මුදියන්සේලාගේ කිරිමුදියන්සේ හේරත් මහතා

(22) තලවත්තේගෙදර, නැබෝරුව පදිංචි ළුද්දහැවිට හේනායලාගේ බස්තියන් මහතා

(ආ) උහුමීය, බුලුපිටිය පදිංචි ජයවීර මුදියන්සේලාගේ විජේරත්න ජයවීර මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මෙ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1975 මාර්තු මස 27 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

4-182/3—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

සමගි මණ්ඩල පනත

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (7) හා 4 (3) යන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, 1974 පෙබරවාරි මස 15 වැනි දින අංක 99 දරන ගැසට් නිවේදනය මගින් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කටාන ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සියලුම සාමාජිකයින් සහ සභාපති ද එකී තනතුරුවලින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1975 මාර්තු මස 31 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

4-241—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

## සමගි මණ්ඩල පනත

### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නීතිවේ දනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1973 ජූනි මස 29 වැනි දින අංක 66 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 12 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටි දියතිලක ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) හගුරන්කෙත, පුස්සලමංකඩ පදිංචි අතපත්තු විජේකෝන් මුදියන්සේලාගේ රොබට් විජේකෝන් මහතා

(2) හගුරන්කෙත, බෙකරියෙහි දොන් විජේවන්ත අකුරළිය විමලසේන මහතා

(3) හගුරන්කෙත, බොරලැස්ස පාර පදිංචි සිරිවර්ධනගේ දොන් විල්සන් සිරිවර්ධන මහතා

(4) හගුරන්කෙත, ' ශාන්තිනිවස ' පදිංචි වික්‍රමසිංහ නානායක්කාර මහතා

(5) හගුරන්කෙත, යටිහගුරන්කෙත, වේහිරියාවත්ත පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ විජේකෝන් බණ්ඩා මහතා

(6) හගුරන්කෙත, පහලවත්ත පදිංචි මාලියද්දේගෙදර සිරිමලා මහතා

(7) හගුරන්කෙත, නිස්සපැල පදිංචි පූජ්‍ය හගුරන්කෙත සුමනජෝති හිමි

(8) හගුරන්කෙත, පුස්සලමංකඩ පදිංචි රටගෙදර හේරත් මුදියන්සේලාගේ කුඩා බණ්ඩා මහතා

(9) හගුරන්කෙත, පුස්සලමංකඩ පදිංචි ඒකනායක මුදියන්සේලාගේ ලොකුබණ්ඩා මහතා

(10) හගුරන්කෙත, දමුණුමැය, බෝදන්බරුවේගෙදර පදිංචි ඉලංගන්තිලක මුදියන්සේලාගේ සෙනෙවිරත්න බන්ඩා මහතා

(11) හගුරන්කෙත, දමුණුමැය පදිංචි රත්නතිලක මුදියන්සේලාගේ මුතුබණ්ඩා මහතා

(12) හගුරන්කෙත, මදුරුව පදිංචි පුංචිබණ්ඩා අත්තනායක මහතා

(13) හගුරන්කෙත, වෙල්ලියාවත්ත, දමුණුමැය පදිංචි රාජපක්ෂ නවරත්න වික්‍රමසිංහ මුදියන්සේලාගේ සෝමපාල වික්‍රමසිංහ මහතා

(14) හගුරන්කෙත, පහලවත්ත පදිංචි කහටදෙනියේ ගෙදර මාටින් මහතා

(15) හගුරන්කෙත, අලවතුගම, දමුණුමැය පදිංචි මාලියද්දේ ගෙදර පියදාස මහතා

(16) හගුරන්කෙත, මැදපිටිතැන්න පදිංචි අල්දොර බස්නායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා මහතා

(17) හගුරන්කෙත, පේරවංගුව පදිංචි අබේසිංහ බාස්උන්නැහේ මහතා

(18) හගුරන්කෙත, හපුවල පදිංචි එලහුන්කිරිගෙදර හීන්බණ්ඩා මහතා

(19) හගුරන්කෙත, හපුවල පදිංචි කන්දේගෙදර සෙනෙවිරත්න මහතා

(20) පල්ලේබෝවල, රුකිපිපේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ පහලගම පුංචිබණ්ඩා මහතා

(21) පල්ලේබෝවල, උනන්තැන්න පදිංචි ජයසේකර මුදියන්සේලාගේ ගෙදර හීන්බණ්ඩා මහතා

(22) පල්ලේබෝවල, උනන්තැන්න පදිංචි දුම්බරගෙදර කිරිබණ්ඩා මහතා

(23) පල්ලේබෝවල, උනන්තැන්න පදිංචි ජයසේකර මුදියන්සේලාගේ ඩිංගිරි බණ්ඩා මහතා

(24) හගුරන්කෙක, මාදන්වල පදිංචි රත්නායක මුදියන්සේලාගේ උක්කුබණ්ඩා අත්තනායක මහතා

(25) හගුරන්කෙත, මාදන්වල පදිංචි වීරසූරිය මුදියන්සේලාගේ රත්බණ්ඩා වීරසූරිය මහතා

(26) රිකිල්ලගස්කඩ, උඩගම, දියතිලක පදිංචි දිසානායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා මහතා

(27) රිකිල්ලගස්කඩ, වළගම පදිංචි අබේකෝන් මුදියන්සේලාගේ අප්පුහාමි අබේකෝන් මහතා

(28) රිකිල්ලගස්කඩ, ' අනුරනිවස ' පදිංචි රාජපක්ෂ මුදියන්සේලාගේ ලොකුබණ්ඩා රත්නායක මහතා

(29) රිකිල්ලගස්කඩ, මලලවෙල පදිංචි රත්නායක මුදියන්සේලාගේ උක්කුබණ්ඩා මහතා

(30) රිකිල්ලගස්කඩ, ' සොමිනිවස ' පදිංචි විල්ලෝබි ආරච්චිගේ දොන් පීටර් ගුණසේකර මහතා

(ආ) හගුරන්කෙත, පුස්සලමංකඩ පදිංචි අතපත්තු විජේකෝන් මුදියන්සේලාගේ රොබට් විජේකෝන් මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නියම කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1975 අප්‍රේල් මස 02 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

4–243—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

## 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත

### 16ඇඇ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කිරීමේ දැන්වීම

1972 අංක 17 දරන දේශීය ආදායම් (සංශෝධන) නීතියෙන් සංශෝධිත, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16ඇඇ වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල යටතේ මුදල් අමාත්‍යවරයා විසින් " සීමාසහිත ලක්රුවන් ජෙම්ස් ලිමිටඩ් " විසින් මැණික් අපනයනය කිරීම හෝ වෙළඳාම සඳහා ගෙන යන ව්‍යාපාරය එකී වගන්තියේ කාර්යයන් සඳහා අනුමත ව්‍යාපාරයක් ලෙස ප්‍රකාශ කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. ඒ. කුරේ,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

1975 මාර්තු මස 27 වෙනි දින,
කොළඹ දී ය.

4–234—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

## 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත

### 16ඇඇ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කිරීමේ දැන්වීම

1972 අංක 17 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16ඇඇ වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල යටතේ මුදල් අමාත්‍යවරයා මෙම දැන්වීමෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව සඳහන් වන හා එකී උපලේඛනයේ II තීරුවෙහි ඊට අනුරූපව නිශ්චිතව සඳහන් ඕන සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරය එකී වගන්තියේ කාර්ය සඳහා අනුමත ව්‍යාපාරයක් බවට ප්‍රකාශ කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. ඒ. කුරේ,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

1975 මාර්තු මස 27 වෙනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| I තීරුව | II තීරුව |
| --- | --- |
| හොටෙල් ටොපාස් කැන්ඩි ... | සීමාසහිත මැක්ලරන්ස් රිසෝට්ස් |

4–236—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

එල්. ඕ—ඩී. 8/66

**1966 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනත**

1966 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනතේ 48 (1) වන වගන්තිය යටතේ නාවික කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමය.

අත්සන් කළේ : ඩී. පී. වික්‍රමසිංහ,
වැ. බ. නාවික කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍ය.

1975 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දීය.

නියමය

1966 අංක 10 දරණ සංචාරක මණ්ඩල පනතේ 48 (1) වන වගන්තිය යටතේ සාදනු ලැබ, 1966 ජූලි මස 1 වන දින අංක 14,702 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ, කලින් කල සංශෝධිත, නියමය, "දේශාටන නියෝජිත" යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"දේශාටන නියෝජිත" යන්නෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ට හෝ පිටරටවල සංචාරය කරන ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන්ට පහත දක්වෙන සේවාවන් හෝ පහසුකම් කිසිවක් හෝ සියල්ලම ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා සපයන පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් හෝ නීතිගත කරනු ලැබූ හෝ නොලැබූ සංස්ථාවක් හෝ අදහස් වේ.

(අ) ගමන් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම, හෝ යම් ගමනාගමන මාධ්‍යයක ආසන කලින් වෙන් කරවා ගැනීම ;

(ආ) හෝටලවල, නානායම්වල, අමුත්තන් සඳහා වූ නිවාසවල සහ ඉඳුම් හිටුම් හා කෑම්බීම් සපයන වෙනත් තැන්වල ඉඩකඩ කලින් වෙන් කරවා ගැනීම ;

(ඇ) මෙරටට ඇතුළුවන ගුවන්/නැව් තොට වලදී පිළිගැනීමේත් ගමන් බලපත්‍ර, වීසා බලපත්‍ර, විනිමය පාලන අවසර පත්‍ර වැනි ගමන්වලට අදාල ලේඛන ලබා ගැනීමේ දී හා ගමන් බඩු ගුවන්/නැව් තොටවලින් ලබාගෙන ප්‍රවාහණය කිරීමේ දී සහාය වීමේත් කටයුතු සැලැස්වීම ;

(ඈ) සියල්ල ඇතුලත් පදනමක් මත හෝ විනෝද චාරිකා බලපත්‍ර විකිණීමේ දී කොමිස් මුදලක් ගෙවීමේ පදනම මත හෝ, විනෝද ගමන්, හෝ චාරිකා සංවිධානය කිරීම සහ ඒ විනෝද ගමන්වලට හෝ චාරිකාවලට සම්බන්ධ සේවා පහසුකම් සැපයීම."

4–259—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

# මිල පාලන දැන්වීම්

**මිල පාලන පනත**

1975 අංක ජී. 1 දරණ මිල නියෝගය

කිරිඟු පිටි

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3(2) වගන්තිය සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගාළු දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) අබ්දුල් කාදර් මොහොමඩ් රාසික් වන මම, මේ ආඥාවෙන් —

(1) 1974 අගෝස්තු 15 වෙනි දින අංක 124/9 දරණ ගැසට් පත්‍රයේ පළමු 1974 අංක ජී.1 දරණ මිල නියෝගය 1975 ජනවාරි මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(2) මෙයට යාකර ඇති පළමුවෙනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය 1975 ජනවාරි මස 1 වෙනි දින සිට මෙයට යාකර ඇති දෙවැනි උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් ගාළු පාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි එක් එක් ප්‍රදේශයන්හි තොග වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයන්ට සලාකයට නිකුත් කරන කිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් 112 ක් විකිණිය හැකි වැඩිම මිල එහිවූ දෙවැනි උපලේඛණයේ 2 වැනි තීරයේ සඳහන් මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙයට යාකර ඇති පළමුවෙනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය 1975 ජනවාරි මස 01 වෙනි දින සිට මෙයට යාකර ඇති දෙවන උපලේඛණයේ පළමුවෙනි තීරයේ සඳහන් ගාළු පාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි එක් එක් ප්‍රදේශයන්හි සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයකුට සලාකයට විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල එහි වූ දෙවැනි උපලේඛණයේ 3 වෙනි තීරයේ සඳහන් මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) මෙයට යාකර ඇති පළමුවෙනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය 1975 ජනවාරි මස 01 වෙනි දින සිට මෙයට යාකර ඇති දෙවැනි උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් ගාළු පාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි එක් එක් ප්‍රදේශයන්හි තොග වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයන්ට සලාකයෙන් බැහැරව නිකුත් කරන කිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් 112 ක් විකිණිය හැකි වැඩිම මිල එහිවූ දෙවැනි උප ලේඛණයේ 4 වෙනි තීරයේ සඳහන් මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(5) මෙයට යාකර ඇති පළමුවෙනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය 1975 ජනවාරි මස 01 වෙනි දින සිට මෙයට යාකර ඇති දෙවැනි උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් ගාළු පාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි එක් එක් ප්‍රදේශයන්හි සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයන්ට සලාකයෙන් බැහැරව විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල එහි වූ දෙවැනි උපලේඛණයේ 5 වෙනි තීරයේ සඳහන් මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(6) කිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 112 කට වැඩියෙන් තොග වශයෙන් ඕනෑම ප්‍රමාණයක් සලාකයට විකිණීමේදී ඊට ගෙවිය යුතු වැඩිම මිල ගණන් සාදගත යුත්තේ මෙයට යාකර ඇති දෙවැනි උපලේඛණයෙහි 2 වෙනි තීරයේ සඳහන් ශුද්ධ බරින් රාත්තල් 112 ක් විකිණිය හැකි වැඩිම තොග මිල ප්‍රමාණය අනුව සලකා ක්‍රමානුකූලව ගණන් බැලීමෙනි.

(7) කිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 112 කට වැඩියෙන් තොග වශයෙන් ඕනෑම ප්‍රමාණයක් සලාකයෙන් බැහැරව විකිණීමේදී ඊට ගෙවිය යුතු වැඩිම මිල ගණන් සාදාගත යුත්තේ මීට යාකර ඇති දෙවැනි උපලේඛණයේ 4 වෙනි තීරයේ සඳහන් ශුද්ධ බරින් රාත්තල් 112 ක් විකිණිය හැකි වැඩිම තොග මිල ප්‍රමාණය අනුව සලකා ක්‍රමානුකූලව ගණන් බැලීමෙනි.

(8) තවද මෙම නියෝගයේ කාර්යයන් සඳහා—

(අ) මෙයට යාකොට ඇති පළමුවෙනි උපලේඛණයේ සඳහන් කිරිඟු පිටි යන්නට ඉරිඟු පිටි මිශ්‍ර කිරිඟු පිටිද ඇතුළත් යයි සලකනු ලැබේ;

(ආ) කිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීමද ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකවර විකිණීම ද තොග වෙළඳාමක් සේ සලකනු ලැබේ;

(ඇ) ශුද්ධ බරින් හොණ්ඩරයකට වඩා අඩු කිරිඟු පිටි ප්‍රමාණයක් ආහාරය සඳහා විකිණීම සිල්ලර වෙළඳාමක් සේ සලකනු ලැබේ;

(9) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ කිසියම් ප්‍රදේශයක ඉරිඟු පිටි සමඟ හැර වෙන කිසියම් ද්‍රව්‍යයක් හැර නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(10) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක කිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ තමාගේ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම කිරිඟු පිටි වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ පිටි වලට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල උසින් අඟලකට වඩා වැඩි නොවූද ඉලක්කම් වලින් මිල පුවරුවක සඳහන් කොට එම පුවරුව එම භාජනයට ඇඳා පිටි ද එම පුවරුවද ඕනෑම ගණුදෙනු කාරයෙකු ට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙයින් නියම කරමි.

(11) එසේම මෙම නියෝගයෙහි කාර්යන් සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද, මෙයින් නියම කරමි.

(12) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම කිරිහු පිටි විකුණන සියල්ලෙක්ම තොග වශයෙන් විකිණීමේදී කුවිතාන්සියක් නිකුත් කිරීම අවශ්‍ය බවද, සිල්ලර වශයෙන් මිලදී ගන්නා අය ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර සහිත කුවිතාන්සියක් ඔවුනට දිය යුතු බව ද මෙයින් නියම කරමි :—

(අ) විකුණූ දිනය ;

(ආ) කිරිහු පිටි විකුණූ ප්‍රමාණය බර අනුව ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන් ද නැතහොත් සිල්ලර වශයෙන් ද යන වග ;

(13) කිරිහු පිටි විකිණීමේදී එය යම්කිසි දෙයක බහාලනු ලැබුවේ නම් හෝ ඔතනු ලැබුවේ නම් එහි මිලත් මෙම නියෝගයේ නියමිත මිල ගණන් වලට ඇතුළත් විය යුතු බව මෙයින් නියම කරමි.

ඒ. සී. එම්. රාසික්,
ගාළු පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක
(ආහාර හා විවිධ ද්‍රව්‍ය).

1975 මාර්තු මස 13 දින,
ගාල්ලේ දිසාපති කාර්යාලයේදී අත්සන් කරන ලදී.

පළමුවෙනි උපලේඛනය

හැඳින්වීම හා වර්ගය—කිරිහු පිටි

දෙවැනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | | 2 වෙනි තීරය<br>ශුද්ධ බර රාත්තල් 112ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල (සලාකයට) | | 3 වෙනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල (සලාකයට) | | 4 වෙනි තීරය<br>ශුද්ධ බර රාත්තල් 112 ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල (සලාකයෙන් බැහැරව) | | 5 වෙනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල (සලාකයෙන් බැහැරව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| ගාලු නාගරික සීමාව සහ කඩවත් සතර, අක්මීමන ගම්සහා සීමාව, බෝපෙ ගම්සහා සීමාව, පොද්දල ගම්සහා සීමාව | ... | 119 22 | ... | 1 12 | ... | 123 54 | ... | 1 12 |
| අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා සීමාව, මාදම්පේ ගම්සහා සීමාව | ... | 119 38 | ... | 1 12 | ... | 123 70 | ... | 1 12 |
| වතුගෙදර සුළු නගර සභාසීමාව, කරන්දෙණිය ගම සභා සීමාව | ... | 119 42 | ... | 1 12 | ... | 123 74 | ... | 1 12 |
| ගෝරගොඩ ගම් සභා සීමාව, බටපොල ගම් සභා සීමාව | ... | 119 38 | ... | 1 12 | ... | 123 70 | ... | 1 12 |
| අහංගම සුළු නගර සභා සීමාව, කතළුව ගම් සභා සීමාව, පිලාන වැටරඹ ගම් සභා සීමාව, කහඳ නාකන්ද ගම් සභා සීමාව, පරගොඩ ගම් සභා සීමාව ... ... ... | ... | 119 44 | ... | 1 12 | ... | 123 76 | ... | 1 12 |
| හබරාදූව ගම් සභා සීමාව (මැලෑගොඩ ග්‍රා.සේ. කොට්ඨාශය හැර) | ... | 119 28 | ... | 1 12 | ... | 123 60 | ... | 1 12 |
| මැලෑගොඩ ග්‍රාමසේවක කොට්ඨාශය ... | ... | 119 26 | ... | 1 12 | ... | 123 58 | ... | 1 12 |
| කෝදගොඩ ගම් සභා සීමාව සහ පොල්පාගොඩ ගම් සභා සීමාව | ... | 119 44 | ... | 1 12 | ... | 123 76 | ... | 1 12 |
| කොඨටව ගම් සභා සීමාව ... ... | ... | 119 46 | ... | 1 12 | ... | 123 78 | ... | 1 12 |
| බද්දේගම ගම් සභා සීමාව, වඳුරඹ ගම් සභා සීමාව, තෙලිකඩ, මාපුවාන ගම් සභා සීමාව ... ... | ... | 119 36 | ... | 1 12 | ... | 123 68 | ... | 1 12 |
| පිටිගල වැහිහේන ගම්සභා සීමාව (පිටිගල ග්‍රා.සේ. කොට්ඨාශය හැර) | | 119 64 | ... | 1 12 | ... | 123 96 | ... | 1 12 |
| පිටිගල ග්‍රාමසේවක කොට්ඨාශය ... | ... | 119 17 | ... | 1 12 | ... | 123 49 | ... | 1 12 |
| පොද්දියවෙල නියාගම ගම්සභා සීමාව, වැලිවිටිය දිවිතුර ගම්සභා සීමාව | | 119 64 | ... | 1 12 | ... | 123 96 | ... | 1 12 |
| දෙඩන්දූව සුළු නගර සභා සීමාව, රත්ගම ගම් සභා සීමාව | ... | 119 17 | ... | 1 12 | ... | 123 49 | ... | 1 12 |
| හික්කඩුව සුළු නගර සභා සීමාව, තොටගමුව තිරාණගම ගම් සභා සීමාව, ගෝනාපීනුවල මිටියාගොඩ ගම් සභා සීමාව ... | ... | 119 22 | ... | 1 12 | ... | 123 54 | ... | 1 12 |
| බලපිටිය සුළු නගර සභා සීමාව ... ... | ... | 119 44 | ... | 1 12 | ... | 123 76 | ... | 1 12 |
| ඌරගස්මංහන්දිය ගම් සභා සීමාව, පහළගම්භය ගම්සභා සීමාව | ... | 119 57 | ... | 1 12 | ... | 123 89 | ... | 1 12 |
| කොස්ගොඩ ගම් සභා සීමාව ... ... | ... | 119 48 | ... | 1 12 | ... | 123 80 | ... | 1 12 |
| බෙන්තොට සුළු නගර සභා සීමාව, ඉඳුරුව ගම් සභා සීමාව | ... | 119 60 | ... | 1 12 | ... | 123 92 | ... | 1 12 |
| ඇල්පිටිය සුළු නගර සභා සීමාව, අම්බන පිනිකහන ගම් සභා සීමාව, ගොළුවාමුල්ල ඕමත්ත ගම් සභා සීමාව ... | ... | 119 08 | ... | 1 12 | ... | 123 40 | ... | 1 12 |
| නාගොඩ මාපලගම ගම් සභා සීමාව, උඩුගම ගම් සභා සීමාව, යටලමත්ත ගම් සභා සීමාව ... ... | ... | 119 57 | ... | 1 12 | ... | 123 89 | ... | 1 12 |
| හිනිදුම ගම් සභා සීමාව, ඕපාත ගම් සභා සීමාව, නෙළුව ගම් සභා සීමාව, දෙල්ලව ගම් සභා සීමාව ... | ... | 119 78 | ... | 1 12 | ... | 124 10 | ... | 1 12 |

සැලකිය යුතුයි : මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි නියම මිල ගණන් නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉහළම මිල ගණන්ය. මෙම ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

4-263—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**1959 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරන ණයසහනදායක ආඥාපනත**

1959 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරණ ණයසහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ අංක 1 සහ 2 යන ශීර්ෂයන්හි දැක්වෙන ණයකරුවන් හා ණයහිමියන් යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ණයසහනදායක මණ්ඩලය අදහස් කර ඇත.

මෙ සඳහා ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය පිළිබඳ විස්තර ප්‍රකාශයන් 1975 අප්‍රේල් මස 16 වෙනි දිනට පෙර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස ණයහිමියන්ට මෙයින් දන්වනු ලැබේ.

කේ. ඒ. ඩී. බී. කරුණාරත්න,
ණයසහනදායක මණ්ඩලයේ ලේකම්.

කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ,
අංක 33/1, "අමීරා" දරණ ස්ථානයේ පිහිටි,
ණයසහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ දීය.
1975.3.24

උපලේඛනය

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 28552 | ඩබ්. ඇම්. බබා හාමිනේ, "ගම්මන්පිල නිවස,, වතුමුල්ල (හාල්ග්‍රන්ඔය හරහා) | හීන්කොට් විතානගේ ආරියපාල, රාගල, හාල්ග්‍රන්ඔය හරහා |
| 28557 | ඇස්. අබලින් ප්‍රනාන්දු, ගිරිදර, කපුගොඩ | පී. ඩී. එලියස් කරුණාරත්න, කපුගොඩ |
| 28558 | කේ. ඩී. ටී. කොඩිතුවක්කු, පනාපුගොඩ, බද්දේගම | කු. පී. නවරත්න, අඹගහවත්ත, බද්දේගම උතුරු, බද්දේගම |
| 28559 | ධර්මදස සිල්වා විජේතුංග, 189/57, සුභසාධක මාවත, පමුණුව පාර, මහරගම | ඩී. ඇල්. පී. ජයවර්ධන, 21, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල නුගේගොඩ |
| 28560 | කේ. ආනන්ද කුමාරසාමි, "ආකව නිල්ලයම්" කරවෙඩ්ඩි බටහිර, කරවෙඩ්ඩි | වේලන් කාන්තන්, "අසුපති වාස" කරවෙඩ්ඩි බටහිර, කරවෙඩ්ඩි |
| 28561 | එස්. ඩැනියෙල්, කරවෙඩ්ඩි බටහිර, කරවෙඩ්ඩි | වල්ලි කාර්ති, කිරෙයි පිල්ලෙයාර් පාර, කරවෙඩ්ඩි බටහිරට කරවෙඩ්ඩි |
| 28562 | ඇන්. චාර්ලිස් සිල්වා, කුඩාපයාගල, පයාගල | 1. ටී. ඒ. එඩ්වින් අප්පුහාමි, 2. අයි. දයාවතී ගුණවර්ධන, නාගහදූව, පයාගල |
| 28565 | හෙන්රි අබේසේකර, පාසැල පාර, වැලිපැන්න | යූ. ඒ. පීරිස් අප්පුහාමි, ඌරාගොඩ, නාගොඩවත්ත, වැලිපැන්න |
| 28566 | විමලසිරි අබයරත්න, බටුවන්දර, පිලියන්දල | ජේ. වික්ටර් ආටිගල, උප–තැපැල් ස්ථානාධිපති, මඩපාත |
| 28567 | එච්. පී. සෙනවිරත්න, කීනදෙනිය, අඹේපුස්ස | එච්. පී. එඩමන් කුලසිංහ, කීනදෙනිය, අඹේපුස්ස |
| 28570 | ඩබලිව්. ජී. ජිනේන්ද්‍රදස, අංක 109, වැවල, හරන්කහව | ඩබලිව්. එම්. මාටින් උඩදෙනිය, වැවල, හරන්කහව |
| 28573 | 1. සී. ශෙල්ටන් ප්‍රනාන්දු, 2. සී. එලිසබෙත් අයිරාංගනි ප්‍රනාන්දු, බදු වත්ත, මෝල ඉදිරිපිට, ආඩිමුල්ල, කටාන | සී. ජොශප් ප්‍රනාන්දු, සී. ඇන්ටනි ප්‍රනාන්දු භාරේ, බාබර් සැලූන් වැල්ලවගෙදර |
| 28574 | එන්. කේ. එච්. සිසිලියානා අමාරාවතී, "සිසිල", කදුරුදූව, වංචාවල | විදනගමගේ අමරදස, "ලක්මිණී", කලහේ, වංචාවල |
| 28576 | එම්. රාමලිංගම්, කොලේජ් පටුමග, කොකුවිල් නැගෙනහිර, කොකුවිල් | 1. රාමලිංගම් තම්බිරාජා, 2. භායඞාච–රාසම්මා, කඩ්ඩුඩ්, මනිපේ, |
| 28577 | එස්. වී. මීරා සයිබු, තන්නියුටු, මුලිලියාවලෙයි | කේ. මයිලාමනි, කනුක්කර්නි, මුල්ලියාවලෙයි |
| 28578 | එස්. සුබ්‍රමනියම්, භාරතී වීදිය, අංක 98, ත්‍රිකුණාමලය | එන්. එක්ස්. ජෝකිම්, ග්‍රෙගරි වලවු, පන්ඩෙයිතිරුප්පු |
| 28579 | එස්. ඒ. මියුලින් හේමලතා, අංක 36, දිප්පිටිගොඩ, කැළණිය | වී. ඒ. මිලන් පෙරේරා, අංක 17, මෙගොඩ කොලොන්නාව, වැල්ලම්පිටිය |
| 28581 | ජයසිංහ මොල්ලිගොඩ, ඉංගිරිය | කේ. එල්. හේරත් අප්පුහාමි, පාදුක්ක පාර, ඉංගිරිය |
| 28583 | 1. එච්. පී. ඔස්ටින්, 2. එච්. පී. මෙරිහාමි, 3. එච්. පී. ආකර්, ගෝනුල්ල ගෝනවිල | එච්. පී. රපියල් අප්පුහාමි, ගෝනුල්ල, ගෝනවිල |
| 28584 | ජේ. ඒ. ඩී. මර්තිනා හාමිනේ, ගෝනුල්ල, ගෝනවිල | එච්. පී. රයියල් අප්පුහාමි, ගෝනුල්ල, ගෝනවිල |
| 28585 | ඒ. ඒ. ජාසින් අප්පුහාමි, අංක 15, සුදර්ශන පාර, ගම්පහ | පී. කුස්මා ප්‍රානන්දු, කෙහෙල්බද්දර, උඩුගම්පොල |
| 28588 | ඩී. ඇම්. ඩිංගිරි අම්මා, "සමරවිලා" අඹන්පොල | ඇම්. සිටින්, අංක 68, අබකොලවැව කොලනිය, අඹන්පොල |
| 28589 | ලියනොරා සිරිසේන, කලුපේ, හික්කඩුව | එල්. ගාබ්‍රියෙල් සිල්වා, තොටගමුව, කලුපේ, හික්කඩුව |
| 28591 | කේ. දේවගේ සොපියා, කැන්දගහමඩිත්ත, ලින්දර, මීරිගම | ටී. මනිවෙල් ප්‍රනාන්දු, උල්ලලපොල, දිවුලපිටිය |
| 28592 | කේ. සෝමාවති ද සිල්වා, කේ. ටී. ද සිල්වා හේවාවසම්, මීගහවත්ත, මාදම්පේ, අම්බලන්ගොඩ | ඇම්. නන්දවති ද සොයිසා, ඉඩම්තොට, මාදම්පේ, අම්බලන්ගොඩ |
| 28593 | විදනගේ ධර්මවර්ධන යාපා, කෝරලේ වත්ත, දෙවෙනි පටුමග, හෙට්ටි වීදිය, වැලිගම | එච්. ඩබ්. බන්දුලසේන, ඌරුපිටිය, විරුප්ප, දෙනිපිටිය |
| 28594 | 1. එම්. එම්. අහමඩ් මුබාරක්, 2. එම්. එස්. නූර් සකියා, අංක 31, 32වෙනි පටුමග, වැල්ලවත්ත, කොළඹ 6 | ඉස්මයිල් ඒ. පටේල්, අංක 252, වේල්ලවීදිය, කොළඹ 11. |
| 28595 | එච්. පී. ඔස්ටින් පොන්සේකා, අංක 131/1ඒ, බොධි මාවත, කොරළවැල්ල, මොරටුව | එම්. එස්. පෙරේරා, අංක 123, කොරළවැල්ල, මොරටුව |
| 28597 | හටුවන්පේඩිගේ කරුණාදස, අස්සැන්නවත්ත, දිවුලපිටිය | දෙරවකගේ ප්‍රේමදස, ඉහලමඩම්පැල්ල, දූනගහ |
| 29599 | කළුබොවිලගේ ධර්මදස, උඩහලුනුගම, මණ්ඩාවල | කේ. බී. පොඩිඅප්පුහාමි, උඩහලුනුගම, මණ්ඩාවල |
| 28600 | රෙජිනල් රත්වත්තේ, ගලගෙදර, මැදගොඩවත්ත | ඩී. ඇම්. කේ. දිසානායක, නාරන්වල, ගලගෙදර |
| 28601 | එච්. එම්. උක්කු මැණිකා මඉහල වීරකොඩියාන, පනිරන්ඩාව, මාදම්පෙ | ඩබ්. එම්. ප්‍රනාන්දු, කදුරු වැව, බිංගිරිය |
| 28602 | රෙජිනා වන්නිගම, මුහුදුමාවත, කංගල්ල | 1. මියගිය ප්‍රේමදස විදන පතිරණ මයාගේ උරුමක්කාරිය ;— නන්දවති වෙත්තිසිංහ, කජුගස්හේන, මහහිල්ල,. බෙලිඅත්ත. 2. ඇම්. ජී. ජී. දෙන් මාටින් නුගේහේන, පල්ලත්තර, බෙලිඅත්ත |
| 28603 | කුරුප්පු ආරච්චිලාගේ සුගතපාල, අටාල, උඩුගම | කේ. ඒ. පොඩිනිලමෙ, අටාල, උඩුගම |
| 28604 | මද්දුමදේවගේ එඩ්වින්, 429, ගෝධාභය පාර, වනවාසල, කැළණිය | මියගිය ජේ. ඒ. ඩී. ජුලිස් ගුණසේකර මයාගේ උරුමක්කරුවෝ ;— 1. ඒ. ජයකොඩි, මාතලාන, නිට්ටඹුව, 2. එල්. එම්. ගුණවර්ධන, කැනිහෙල, වේවැල්දෙනිය |

| ඇප්තුම් පත් අංකය | ණය කරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 28605 | පී. ජී. රොසලින් නෝනා, එච්චත්ත, දුංකන්නාව, නාත්තන්ඩිය | පී. ජී. ධර්මසේන, අංක 71, ඔරුතොට, ගම්පහ |
| 28606 | පී. අන්තෝනි හොනිස්, 103, ඇල්ලතොට, බණ්ඩාරවෙල | එල්. ජී. ඒ. සුමනපාල, 103, ඇල්ලතොට, බණ්ඩාරවෙල |
| 28607 | මොහමඩ් සාලි මොහමඩ් ඊබ්‍රාහිම්, අංක 21 සී, වැලි අංගෙවත්ත, මුරුතලාව | ඇම්. ජී. බිළිඳා මුදලාලි, දෙහිගම, මුරුතලාව |
| 28609 | ඉඳුප්පැල්ල කංකානම්ගේ ධර්මසේන, දෙවෙනි ගුරුගේවත්ත, කිරානේගම, හික්කඩුව | මියගිය කේ. ජී. ජෝන් අප්පුහාමිගේ උරුමක්කරුවෝ :— 1. කේ. ජී. ඩයස්, 2. කේ. විල්බට්, කේ. ඇක්මන්, කිරානගම, හික්කඩුව |
| 28613 | ඇම්. ජී. සුවාරිස්, නිලන්තෝරුව, මාදිපොල | ඉහලගෙදර සුන්දරා, නිලන්තෝරුව, මාදිපොල |
| 28614 | ඇන්. යූ. ජයතිස්ස ආර්. පී.ඩී. මල්ලි, වෙරගල, නාරම්මල | 1. එච්. පී. ඩී. ඉන්ද්‍රාවතී, 2. ඒ. ඩී. හොරතලා, වෙරගල, නාරම්මල |
| 28616 | 1. සොලමන් එලියස්, 2. භාර්‍යාව–ලූර්තම්මා, 6 වෙනි හරස් වීදිය., ගුරුනගර්, යාපනය | 1. එල්. ඊ. බැස්ටියන් පිල්ලෙයි, 2. පුෂ්පම්ගේ භාර්යාව රීටම්මා, 3. අර්නස්ගේ භාර්යාව පාකියම්, 4. රොබට්ගේ භාර්යාව ග්‍රේස් මනී, 5. අන්තෝනිපිල්ලේගේ දුව අල්වීනම්මා, ගුරුනගර්, යාපනය |
| 28618 | කොට්ටාසගේ සීලවතී, ''සිංහලෙන'', ඉඹුල්ගොඩ, බදුල්ල | ලූ. හේ. බන්දුලදස, අංක 3, මධ්‍යම වෙළඳ පොල, බදුල්ල |
| 28621 | 1. සෙල්ලාර් සින්නකුඩි, 2. භාර්යාව–පොන්නම්මා, කරනවෙයි උතුර, කරවෙඩ්ඩි | ටී. සෙල්ලතුරෙයි, ''චන්ද්‍ර වාන්තයි'', කරනවෙයි උතුර, කරවෙඩ්ඩි |
| 28622 | කේ. අප්පදොරේ, කුලන්කරෙයි, කරනවෙයි උතුර, කරවෙඩ්ඩි | ටී. සෙල්ලතුරෙයි, කලන්තරෙයි, කරනවෙයි උතුර, කරවෙඩ්ඩි |
| 28623 | පී. ඒ. පොඩිඅප්පුහාමි, උඩුකුඹුර, තෙලුම්දෙනිය | ජේ. ඒ. හෙන්ද්‍රික් සිංඤෝ. කෙහෙල්වල, තෙලුම්දෙනිය |
| 28624 | එස්. ඒ. එම්. ජෝන් සිංඤෝ, කොට්ටයා වත්ත, මාරපොල, වේයන්ගොඩ, | එස්. ඒ. එම්. ඒ. බෙලින් නෝනා, කොට්ටයාවත්ත, මාරපොල, වේයන්ගොඩ |
| 28626 | ලීලාවතී අමරසූරිය, අංක 293, සර්කියුලර් පාර, දේවාතුර, මාගොල්ල, ගාල්ල | ජී. එන්. ටී. ද සිල්වා, සර්කියුලර් පාර, දේවාතුර, මාගාල්ල, ගාල්ල |
| 28627 | එච්. ද්‍රෝන මේරි, 73, කලවතුගොඩ පාර, මාදිවෙල, කෝට්ටෙ | ආර්. ඩබ්ලිව්. අලහකෝන්, අංක 43, මුවර් පාර, වැල්ලවත්ත, කොළඹ |
| 28628 | ජී. කලුආරච්චිගේ නන්දවතී, පොල්පැලවත්ත, කනක්කේ, ඉමදූව | බී. සෝමාවතී ධර්මපාල, රාහුල පාර, මාතර |
| 28629 | එම්. ඒ. චන්ද්‍රලතා, 640 බී, දුම්රියපල පාර, හුනුපිටිය, වත්තල | එම්. එස්. නන්දසේන, 75, මැදවත්ත, කටුවන්ගොඩ, වේයන්ගොඩ |
| 28630 | 1. ඒ. එම්. පීරිස්, 2. ඩී. එම්. ප්‍රනාන්දු, 3. ඩී. ඩබ්. ප්‍රනාන්දු, 4. එම්. එස්. ප්‍රනාන්දු, 5. ඩී. එන්. ඩී. ප්‍රනාන්දු, 6. ඩී. ටී. ටී. ප්‍රනාන්දු, 7. ඩී. ආර්. ප්‍රනාන්දු, 4/95, ගාලු පාර, දෙහිවල | කමනී ශන්මුගම්, අංක 45 3/2, ගාලු පාර, වැල්ලවත්ත, කොළඹ 6 |
| 28635 | එස්. විජේරාම, අංක 61, පළවෙනි මරදන, මරදාන, කොළඹ 10 | සී. ටී. එන්. ජෙරල් ද සිල්වා, මීගමු පාර, කුරණ, කටුනායක |
| 28637 | කේ. කනපතිපිල්ලේ, ''සෙල්වගිරි'' අනෙයි කොඩ්ඩෙයි | 1. එස්. ආරුමුගම්, 2. භාර්යාව–සිවමනී, මනෙයිතාරෙයි පටුමග, කන්ධර් මඩම, තිරුනල්වැලි, යාපනය |
| 28638 | අයි. කරුපයියා, 396/2, දෙමටගොඩ පාර, කොළඹ 9 | ටී. වනිගසිංහම්, 10, ද සොන්සේකා පාර, වැල්ලවත්ත, කොළඹ 5 |
| 28640 | ටී. ගනේශමූර්ති, දෙමල කොට්ඨාශය, සමන්තුරෙයි | ඒ. කනීසා උම්මා, කොට්ඨාශ අංක 4, සමන්තුරෙයි |
| 28641 | ටී. එස්. ඩබ්. ප්‍රනාන්දු, 26/2, ඉහල ඉඳිබැද්ද, මොරටුව | ටී. ඩබ්. ප්‍රනාන්දු, ''සම්පත'' දම්පේ, මඩපාත<br>පවරනලද අය :—<br>එම්. හෙන්රි ජේකබ් ප්‍රනාන්දු, 102/5, ලක්ෂපතිය පාර, මොරටුව |
| 28642 | 1. එස්. සින්නතුරේ, 2. එස්. මහරානි, 3. එස්. සිවප්‍රකාසම්, බාමාපති, මනිජේ | ජයලක්ෂමී (තම්බිරාජාගේ දුව), අංක 44, සිවන් වීදිය, ත්‍රිකුණාමලය |
| 28644 | පී. එම්. එස්. අලහුදීන්, මුදලාපලි, තලවිල | එන්. එම්. එල්. එම්. ඒ. කාදර්, මුදලාපලි, තලවිල |
| 28645 | එම්. එල්. බෝගහවත්ත, ඌරුබොක්ක | අයිරින් රාජපක්ෂ, ඌරුබොක්ක |
| 28647 | සමරතුංග ආරච්චිගේ විල්බට් පෙරේරා, 79/1, දික්හේනවත්ත, කිරිමැටියාගාර, කඩවත | අරඹවල විල්සන් විල්බට්, ''සෝමවිලා'', ඇල්ලගම, දියතලාව |
| 28649 | එස්. අයි. සන්තියෝ සාදම්, 14, අසේ වීදි, කයිතූර්, යාපනය | 1. ඒ. ඥානසේකරම්, 2. ඒ. ජයලක්ෂුමී, ''කුමරගිරි'', චුන්නාකම් |
| 28650 | ඩබ්. ඇම්. රන්බණ්ඩා, ඇහැලමල්පෙ, කරදෙගොල්ල | ටී. ඩබ්. පුංචි බණ්ඩා, පල්ලේගම, අම්පිටිය |
| 28081 | සම්සුදීන් මොහමඩ් සුපියාන්, එයිතල්වතුනුවර, ඇම්. වී., මහපොතාන, අනුරාධපුරය | යූ. ඇම්. ආර්. මුදලිහාමි, කෝන්ගමුව, මාවනැල්ල |
| 28092 | එස්. සවපිරගාසම් පිල්ලේ, කනගම් මිල්ස්, තිරුඥානසම්පන්දර් වීදිය, ත්‍රිකුණාමලය | 1. සිවපාක්කියම්පිල්ලේ, 2. භාර්යාව : අරසම්මා, අල්වයි උතුර, ජවරිමූලෙයි, පොයින්ට් පේද්‍රු |
| 28107 | ඩී. ඇම්. කේ. දිසානායක, කුඹුක්වැව පාර, විලව, බලල්ල | ඩී. එම්. පුංචිබණ්ඩා, සාමාන්‍ය වෙළෙඳ තැන, ඉඹුල්ගොඩයාගම, බලල්ල |
| 28757 | කේ. පී. ඩී. එස්. ගුණසේකර, අංක 226 ඩී, උදම්විට, ජාඇල | ඩබ්. යූ. ඩී. එස්. කුළසේකර, ''සුනිල්සිරි සෙවන'', උදම්මිට, ජාඇල |
| 28693 | 1. ඩී. සී. අලහේන්ද්‍ර, 2. පී. ඒ. ඇල්බි නෝනා, දෙරනගොඩ, උඩුගම්පොල | යූ. ඒ. ලනයල්, දෙරනගොඩ, උඩුගම්පොල |
| 28711 | ඩී. ජේ. මුණසිංහ, වාසිලියද්දේ, මතුගම | එම්. ඒ. ඩී. ලූවිස් අප්පුහාමි, ''ආනන්දසිරි'', කළුතර පාර, මතුගම |
| 28729 | ටී. ඇල්. වික්‍රමසිංහ, අංක 99, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස | ජී. කුක්, 39/1, හෝටල් පාර, ගල්කිස්ස |
| 28733 | පී. පර්ලි පීරිස්, අංක 11, පරාක්‍රම මාවත, කෙසෙල් වත්ත, පානදුර | ටී. ලිස්ලින් ප්‍රනාන්දු, අංක 25, සහබෝ මාවත, කෙසෙල් වත්ත, පානදුර |
| 28766 | යූ. එල්. මොහොමඩ් පලීල්, දෙහිදෙනිය, මඩිහේ, හතරලියද්ද | කේ. ඒ. සයිමුස් ලෙබ්බෙගේ දුව, ජුවාරියත් උම්මා, දෙහිදෙනිය, මඩිහේ, හතරලියද්ද |

4–125—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

**දැන්වීමයි**

වර්ෂ 1948 අප්‍රේල් මස 30 වැනි දින අංක 9,859 දරණ ගැසට් පත්‍රයෙහි පළ වූ ව්‍යවස්ථාවෙන් සංශෝධිත පරිදි, ජාතික කෞතුකාගාර ආඥාපනතේ (187 අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ පැණවුණු ව්‍යවස්ථාවන්හි 3 වැනි ව්‍යවස්ථාව අනුව, කොළඹ, මහනුවර හා රත්නපුර පිහිටා ඇති ජාතික කෞතුකාගාර හා අනුරාධපුර ගැමි කෞතුකාගාරය 1975 අප්‍රේල් මස 14 වැනි දින සහ මැයි 25 වැනි දින පිළිවෙලින් සිංහල සහ හින්දු අළුත් අවුරුද්ද හා වෙසක් පුන් පොහෝ දින නිමිත්තෙන් වසා තබන බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. එච්. ඩී. එච්. ද සිල්වා,
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ.

1975 අප්‍රේල් මස 02 දින,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
කොළඹ 7.

4–231— 75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

**1958 අංක 29 දරණ සත්ව පනත**

1975 වර්ෂයට අම්පාර දිස්ත්‍රික්කයේ කරවාහු පත්තුවේ හංවඩු ගැසීමේ ස්ථානයන් හා දිනයන්

| ග්‍රා. සේ. අංකය | ග්‍රා. සේ. කොට්ඨාශය | හංවඩු ගසන දිනය | හංවඩු ගසන ස්ථානය |
|---|---|---|---|
| 47 | කො. අ. 6, සයින්දමරතු | හැම මාසයකම 1 වැනි බදද දින, දෙසැම්බර් මාසය හැර | ග්‍රා. සේ. කායඞාල |
| 47ඒ | කො.අ. 4/5, සයින්දමරුතු | දෙසැම්බර් හැර අනෙක් හැම මාසයකම 2 වෙනි බ්‍රහස්පතින්ද | එම |
| 50 | කො. අ. 2/3, සයින්දමරුතු | එම | එම |
| 52 | කො. අ. 1, සයින්දමරුතු | එම | එම |
| 53 | දෙ. කො. සයින්දමරුතු | දෙසැම්බර් හැර අනෙක් හැම මාසයකම 1 වෙනි බදද | එම |
| 54 | කො. අ. 5, කල්මුනකුඩි | දෙසැම්බර් මස හැර අනෙක් හැම මසකම 1 වෙනි බ්‍රහස්පතින්ද | එම |
| 55 | කො. අ. 4, කල්මුනකුඩි | එම | එම |
| 56 | කො. අ. 2/3, කල්මුනකුඩි | එම | එම |
| 58 | කො. අ. 1, කල්මුනකුඩි | දෙසැම්බර් හැර අනෙක් හැම මසකම 1 වෙනි බදද | එම |
| 59 | කො.අ .3 කල්මුන | දෙසැම්බර් හැර අනෙක් හැම මසකම 2 වෙනි බ්‍රහස්පතින්ද | එම |
| 61 | කො.අ. 1/2, කල්මුන | දෙසැම්බර් හැර අනෙක් හැම මසකම 1 වෙනි අඟහරුවාද | එම |
| 62 | නයපට්මුන දෙ. කො. | දෙසැම්බර් හැර අනෙක් හැම මසකම 4 වෙනි අඟහරුවාද | එම |
| 64 | නයපට්මුන මු. කො. | එම | එම |
| 66 | පාන්ඩිරුප්පු | දෙසැම්බර් හැර අනෙක් හැම මසකම 1 වෙනි අඟහරුවාද | එම |
| 67 | මරුදමුන කො. අ. 2 | දෙසැම්බර් මස හැර අනෙක් හැම මසකම 3 වෙනි අඟහරුවාද | එම |
| 68 | මරුදමුන කො. අ. 1 | දෙසැම්බර් හැර අනෙක් හැම මසකම 2 වෙනි බ්‍රහස්පතින්ද | එම |
| 69 | වේනෙයිකුඩිරුප්පු | දෙසැම්බර් මස හැර අනෙක් හැම මසකම 1 වෙනි බදද | එම |
| 71 | පෙරියනීලාවන කො. අ. 2 | දෙසැම්බර් හැර අනෙක් හැම මසකම දෙවෙනි අඟහරුවාද | එම |
| 72 | පෙරියනීලාවන කො. අ. 1 | දෙසැම්බර් හැර අනෙක් හැම මසකම 1 වෙනි බදද | එම |

පර්සි අබේසිංහ,
අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති.

දිසාපති කායඞාලය,
අම්පාර.

4–252—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

**1958 අංක 29 දරණ සත්ව පනත**

1975 වර්ෂයට අම්පාර දිස්ත්‍රික්කයේ නින්දවූර්පත්තුවේ හංවඩු ගැසීමේ ස්ථානයන් හා දිනයන්

(ජූලි 1 වැනි සිට ජූලි 31 වැනි ද දක්වා)

| ග්‍රාමසේවක අංකය | ග්‍රාමසේවක කොට්ඨාශයේ නම | හංවඩු ගැසීමේ දිනය | හංවඩු ගැසීමේ ස්ථානය |
|---|---|---|---|
| 37 | නින්දවූර් කො.අ. 5 | 01.07.75 — 03.07.75 | ග්‍රාම සේවක කායඞාලය |
| 38 | නින්දවූර් කො. අ. 4 | 04.07.75 — 06.07.75 | එම |
| 39 | නින්දවූර් කො. අ. 3 | 07.07.75 — 09.07.75 | එම |
| 40 | නින්දවූර් කො. අ. 2 | 10.07.75 — 12.07.75 | එම |
| 41 | නින්දවූර් කො. අ. 1 | 13.07.75— 15.07.75 | එම |
| 42 | කාරතිව් කො. අ. 3 | 16.07.75 — 18.07.75 | එම |
| 43 | මාවඩිපල්ලි | 19.07.75 — 21.07.75 | එම |
| 44 | කාරතිව් කො. අ. 1 | 23.07.75 — 25.07.75 | එම |
| 44ඒ | මාලිමෙකකාඩු | 26.07.75 — 28.07.75 | එම |
| 45 | කාරතිව් කො. අ. 2 | 29.07.75 — 31.07.75 | එම |

1975 දින,
දිසාපති කායඞාලය,
අම්පාර.

පර්සි අබේසිංහ,
අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති.

4–253—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**1958 අංක 29 දරණ සත්ව පනත**

**1975 වර්ෂයට අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තු ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ ගවයින් හංවඩු ගැසීමේ ස්ථානයන් හා දිනයන්**

| ග්‍රාම සේවක අංකය | ග්‍රාමසේවක කොට්ඨාශයේ නම | හංවඩු ගැසීමේ දිනය | හංවඩු ගැසීමේ ස්ථානය |
|---|---|---|---|
| 10 | තිරුක්කෝවිල් | 1975.05.16 — 75.05.23 | තිරුක්කෝවිල් ග්‍රාම සංවර්ධන සමිති ඉඩම |
| | | 1975.05.30 — 75.06.06 | කාන්චිරන්කුඩා ග්‍රාම සංවර්ධන සමිති ඉඩම |
| | | 1975.06.13 — 75.06.20 | කෝරයි කුරුප් එස්ටේට |
| 11 | කොට්ඨාශ 2, තම්බිලුවිල් | 1975.05.13 — 75.05.27 | පල්ලවෙලි කොට්ඨාශ 2 |
| | | 1975.06.24 — 75.06.27 | තම්බිවිලුවිල් |
| | | 1975.07.05 — 75.07.17 | තම්බිලුවිල් |
| 12 | කොට්ඨාශ 1, තම්බිලුවිල් | 1975.05.20 — 75.06.28 | ග්‍රාම සේවක කාර්යාලය |
| | | 1975.09.20 | එම |
| 13 | පනන්කාඩු | 1975.05.09 — 75.05.30 | පනන්කාඩු පාසැල ඉඩම |
| | | 1975.06.05 — 75.06.27 | පුඩඩම්පෙ පාසැල ඉඩම, කන්නගිපුරම |
| 15 | කොට්ඨාශ 1, අක්කරපත්තු | 1975.05.15 — 75.05.29 | ග්‍රාම සේවක කාර්යාලය |
| | | 1975.06.05 — 75.06.12 | ග්‍රාම සේවක කාර්යාලය |
| 16/17 | කොට්ඨාශ 2/3, අක්කරපත්තු | 1975.05.16 — 75.06.20 | ඕ. වයි. එල්. ආදම්ලෙබ්බෙගේ ඉඩම, කෙළින් විදිය, අක්කරපත්තුව |
| | | 1975.07.18 — 75.08.15 | |
| | | 1975.09.19 — 75.09.17 | |
| 18/19 | කොට්ඨාශ 4/5, අක්කරපත්තු | 1975.06.05 — 75.06.12 | පුතු පල්ලයඩි, අක්කරපත්තු |
| | | 1975.06.19 — 75.06.26 | එම |
| 20 | කොට්ඨාශ 6, අක්කරපත්තු | 1975.06.05 — 75.06.13 | පඩ්ඩියඩිප්පිඩඩි, අක්කරපත්තු |
| | | 1975.06.20 — 75.06.27 | එම |
| 21 | කොට්ඨාශ 7, අක්කරපත්තු | 1975.05.07 — 75.06.14 | ආලයඩිවෙම්බු, කොට්ඨාශ 7 |
| | | 1975.06.21 — 75.06.26 | අක්කරපත්තු |
| 22 | කොට්ඨාශ 8/9, අක්කරපත්තු | 1975.05.09 — 75.05.30 | ග්‍රාම සේවක කාර්යාලය |
| | | 1975.06.05 — 75.06.27 | ග්‍රාම සේවක කාර්යාලය |
| 23 | කෝලාවිල් | 1975.05.12 — 75.05.27 | විනායග විද්‍යාලය අසල, කෝලාවිල් |
| | | 1975.05.28 — 75.06.10 | එම |

ඩබ්ලිව්. කේ. ඒ. පී. පී. අබෙසිංහ,
අම්පාර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1975.
දිසාපති කාර්යාලය, අම්පාර

4-254—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම් සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

### 1975

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| මාර්තු | — | 75.03.07 | සිකුරාද | ... | 75.02.28 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.03.14 | සිකුරාද | ... | 75.03.07 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.03.21 | සිකුරාද | ... | 75.03.14 | හිකුරාද | දවල් 12 00 |
| | | 75.03.27 | බ්‍රහස්පතින්ද | ... | 75.03.21 | සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | — | 75.04.04 | සිකුරාද | ... | 75.03.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 00 |
| | | 75.04.11 | සිකුරාද | ... | 75.04.04 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.04.18 | සිකුරාද | ... | 75.04.11 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.04.24 | බ්‍රහස්පතින්ද | ... | 75.04.18 | සිකුරාද | දවල් 12.00 |
| මැයි | — | 75.05.02 | සිකුරාද | ... | 75.04.24 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | | 75.05.09 | සිකුරාද | ... | 75.05.02 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.05.16 | සිකුරාද | ... | 75.05.09 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.05.23 | සිකුරාද | ... | 75.05.16 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.05.30 | සිකුරාද | ... | 75.05.23 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි | — | 75.06.06 | සිකුරාද | ... | 75.05.30 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.06.13 | සිකුරාද | .. | 75.06.06 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.06.20 | සිකුරාද | ... | 75.06.13 | සිකුරාද | දවල් 12.00 |
| | | 75.06.27 | සිකුරාද | . | 75.06.20 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී